# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.04.19 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/628 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.**
***பொலிஸ் ஊடகப் பிரிவிற்கு அறிவிக்கப்பட்ட முக்கிய தகவல்கள்***
**Important information reported to the Police Media Division.**

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇල්පිටිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2026.04.18 දින උදෑසන අම්බලන්ගොඩ පොලිස් වසමේ දේවගොඩ ප්‍රදේශයේදී ඇල්පිටිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 120 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.**

**සැකකරු අවුරුදු 23 ක් වන දේවගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අම්බලන්ගොඩ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***ஹெரோயினுடன் சந்தேகநபர் கைது – எல்பிட்டிய பிரிவின் குற்றவியல் விசாரணைப் பணியகம்.***

*2026.04.18 அன்று காலை, அம்பலங்கொட பொலிஸ் பிரிவின் தேவகொட பகுதியில், எல்பிட்டிய பிராந்திய குற்றவியல் விசாரணைப் பணியகத்தின் அதிகாரிகள் குழு மேற்கொண்ட சோதனையில், 120 கிராம் ஹெரோயின் உடன் ஒருவரை கைது செய்து அம்பலங்கொட பொலிஸ் நிலையத்திற்கு ஒப்படைத்துள்ளனர்.*

*சந்தேகநபர் 23 வயதுடைய தேவகொட பகுதியைச் சேர்ந்தவர். மேலதிக விசாரணைகள் அம்பலங்கொட பொலிஸாரால் மேற்கொள்ளப்படுகின்றன.*

**Suspect arrested with heroin - Elpitiya Divisional Criminal Investigation Bureau.**

On the morning of 2026.04.18, a team of officers from the Elpitiya Divisional Criminal Investigation Bureau conducted a raid in the Devagoda area of Ambalangoda Police Division on a tip-off and arrested a suspect with 120 grams of heroin and presented him to the Ambalangoda Police Station.

The suspect is a 23-year-old resident of Devagoda.

Ambalangoda Police are conducting further investigations..

## 02. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - වලාන මධ්‍යම දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකය.

2026.04.18 දින වලාන මධ්‍යම දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකයේ නිලධාරීන් විසින් මොරගහහේන පොලිස් වසමේ ගොඩිගමුව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් ලීටර් 1125 ක් (බෝතල් 150) සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මොරගහහේන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.**

**එදිනම ගම්පහ පොලිස් වසමේ කෙහෙල් බද්දර ප්‍රදේශයේදී නීති විරෝධී මත්පැන් ලීටර් 97.5 ක් (බෝතල් 130) සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ගම්පහ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 26 හා 65 වයස්වල පසුවන ගෝනපල හන්දිය හා කෙහෙල්බද්දර ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මොරගහහේන හා ගම්පහ පොලිස් ස්ථාන විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## *சட்டவிரோத மதுபானம் உடன் இருவர் கைது – வலான மத்திய ஊழல் ஒழிப்பு அதிரடிப்படை*

*2026.04.18 அன்று, வலான மத்திய ஊழல் ஒழிப்பு அதிரடிப்படை அதிகாரிகள், மொரகஹஹேன பொலிஸ் பிரிவின் கொடிகமுவ பகுதியில் மேற்கொண்ட சோதனையில், 112.5 லீட்டர் (150 பாட்டில்கள்) சட்டவிரோத மதுபானம் உடன் ஒருவரை கைது செய்து மொரகஹஹேன பொலிஸ் நிலையத்திற்கு ஒப்படைத்துள்ளனர்.*

*அதே நாளில், கம்பஹா பொலிஸ் பிரிவின் கெஹெல்பத்தர பகுதியில் 97.5 லீட்டர் (130 பாட்டில்கள்) சட்டவிரோத மதுபானம் உடன் மற்றொருவர் கைது செய்யப்பட்டு கம்பஹா பொலிஸ் நிலையத்திற்கு ஒப்படைக்கப்பட்டுள்ளார்.*

*சந்தேகநபர்கள் 26 மற்றும் 65 வயதுடைய கோனபொல சந்தி மற்றும் கெஹெல்பத்தர பகுதிகளைச் சேர்ந்தவர்கள்.*

*மேலதிக விசாரணைகள் மொரகஹஹேன மற்றும் கம்பஹா பொலிஸாரால் மேற்கொள்ளப்படுகின்றன.*

**Two suspects arrested with illegal liquor - Walana Central Anti-Corruption Unit.**

On 18.04.2026, officers of the Walana Central Anti-Corruption Unit conducted a raid in the Godigamuwa area of the Moragahahena Police Division and arrested a suspect with 1125 liters (150 bottles) of illegal liquor and presented him to the Moragahahena Police Station.

On the same day, a suspect was arrested with 97.5 liters (130 bottles) of illegal liquor in the Kehelbaddara area of the Gampaha Police Division and presented him to the Gampaha Police Station.

The suspects are residents of the Gonapala Junction and Kehelbaddara areas, aged 26 and 65.

Further investigations are being conducted by the Moragahahena and Gampaha Police Stations.

## 03. දිය අනතුරකින් පුද්ගලයෙකු බේරා ගැනීම - අනුරාධපුර පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.

2026.04.18 දින දහවල් අනුරාධපුර පොලිස් වසමේ තිසාවැවේ දිය නාමින් සිටි පුද්ගලයෙකු දියේ ගිලී ඇති අතර අනුරාධපුර පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ රාජකාරි කරන පොලිස් සැරයන් 64782 හේමසිරි, පොලිස් සැරයන් 35475 දහනායක, පොලිස් සැරයන් 60563 කුමාරසිංහ හා පොලිස් සැරයන් 75243 සෙනවිරත්න යන නිලධාරීන් විසින් එම පුද්ගලයා බේරාගෙන මූලික ප්‍රතිකාර ලබා දී වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහල වෙත ඇතුලත් කර ඇත.

**බේරාගෙන රෝහල් ගත කල පුද්ගලයා වයස අවුරුදු 27 ක් වන බණ්ඩාරවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

***நீரில் மூல்கிய நபர் மீட்பு – அனுராதபுரம் பொலிஸ் உயிர்காப்பு அலகு***

*2026.04.18 அன்று மதியம், அனுராதபுரம் திசாவெவையில் நீராடிக் கொண்டிருந்த ஒருவர் மூழ்கிய நிலையில் இருந்தார்.*

*அப்போது பணியில் இருந்த பொலிஸ் உயிர்காப்பு அலகின் அதிகாரிகள் (சார்ஜென்ட் ஹேமசிறி, தஹநாயக்க, குமாரசிங்க, சேனவிரத்ன) இணைந்து அந்த நபரை மீட்டு முதலுதவி வழங்கி மேலதிக சிகிச்சைக்காக அனுராதபுரம் வைத்தியசாலைக்கு அனுப்பியுள்ளனர்.*

*மீட்கப்பட்டவர் 27 வயதுடைய பண்டாரவெல பகுதியைச் சேர்ந்தவர்.*

**Rescuing a person from a water accident - Anuradhapura Police Lifesaving Unit.**

On the afternoon of 18.04.2026, a person who was bathing in the Thisawewa lake in the Anuradhapura Police Division drowned. Police Sergeant 64782 Hemasiri, Police Sergeant 35475 Dahanayake, Police Sergeant 60563 Kumarasinghe and Police

Sergeant 75243 Seneviratne, officers working at the Anuradhapura Police Lifeguard Unit, rescued the person, provided basic treatment and admitted him to the Anuradhapura Hospital for further treatment.

The person who was rescued and admitted to the hospital is a 27-year-old resident of Bandarawela

## 04. දියේ ගිලී පුද්ගලයින් දෙදෙනෙකු මියයාම - තඹුත්තේගම පොලිස් වසම.

2026.04.18 දින සවස තඹුත්තේගම පොලිස් වසමේ නල්ලච්චිය ජලාශයේ වම් ඉවුරෙන් ජලය ගලා බසින ඇල මාර්ගයේ මංකඩක් තුල පිරිමි මළසිරුරු දෙකක් ඇති බවට තඹුත්තේගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුවන් අවුරුදු 19 හා 30 වයස්වල පසුවන බැදිවැව හා තිඹිරිගස්කඩවල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මරණකරුවන් දියනෑමට ගොස් සිටියදී මෙලෙස මෙම අනතුරට ලක්ව ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීර පශ්චාත් මරණ පරික්ෂණය සඳහා තඹුත්තේගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.

තඹුත්තේගම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### *நீரில் மூழ்கி இருவர் உயிரிழப்பு – தம்புத்தேகம பொலிஸ் பிரிவு*

*2026.04.18 அன்று மாலை, நள்ளச்சிய நீர்த்தேக்கத்தின் கால்வாயில் இரண்டு ஆண் உடல்கள் இருப்பதாக கிடைத்த தகவலின் அடிப்படையில் விசாரணைகள் ஆரம்பிக்கப்பட்டுள்ளன.*

*இறந்தவர்கள் 19 மற்றும் 30 வயதுடைய, பண்டிவெவ மற்றும் திம்பிரிகஸ்கடவல பகுதிகளைச் சேர்ந்தவர்கள்.*

*நீராடச் சென்றபோது இந்த விபத்து ஏற்பட்டுள்ளதாக விசாரணைகளில் தெரியவந்துள்ளது.*

*உடல்கள் தம்புத்தேகம வைத்தியசாலையில் வைக்கப்பட்டுள்ளன.*

### Two persons drowned - Thambuttegama Police Division.

Investigations have been initiated on the evening of 18.04.2026, based on a report received at the Thambuttegama Police Station that two male bodies were found in a ditch on the left bank of the Nallachchiya Reservoir in the Thambuttegama Police Division.

The deceased are residents of the Bendiwewa and Thimbirigaskadawala areas, aged 19 and 30.

The investigation conducted so far has revealed that the deceased had gone swimming when they met with this accident. The bodies have been deposited at the Thambuttegama Hospital morgue for a post-mortem examination.

The Thambuttegama Police are conducting further investigations.

## 05. සැකකටයුතු මරණයක් - පොළොන්නරුව පොලිස් වසම.

2026.04.17 දින පොළොන්නරුව පොලිස් වසමේ ගණන්ගොල්ල ප්‍රදේශයේ පුද්ගලයෙකු අතුරුදන්ව ඇති බවට පොළොන්නරුව පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලැබී ඇත. මෙම අතුරුදන් වූ අයගේ මෘත ශරීරය 2026.04.18 දින පරාක්‍රම සමුද්‍රයේ තිබියදී සොයාගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 60 ක් පමණ වූ ගණන්ගොල්ල, පොළොන්නරුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පොළොන්නරුව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

## *சந்தேகத்துக்குரிய மரணம் – பொலன்னறுவ பொலிஸ் பிரிவு*

*2026.04.17 அன்று, கணன்கொல்ல பகுதியில் ஒருவர் காணாமல் போனதாக முறைப்பாடு கிடைத்தது.*

*அந்த நபரின் உடல் 2026.04.18 அன்று பராக்ரம சமுத்திரத்தில் கண்டுபிடிக்கப்பட்டது. இறந்தவர் சுமார் 60 வயதுடையவர்.*

*உடல் பொலன்னறுவ வைத்தியசாலையில் வைக்கப்பட்டுள்ளது. மேலதிக விசாரணைகள் நடைபெற்று வருகின்றன.*

***பொலிஸ் ஊடகப் பிரிவு***

## Suspicious death - Polonnaruwa Police Division.

On 17.04.2026, the Polonnaruwa Police Station received a complaint that a person had gone missing in the Leuragolla area of the Polonnaruwa Police Division. The bodies of these missing persons were found in the Parakrama Samudra on 18.04.2026.

The deceased was a resident of Leuragolla, Polonnaruwa, aged about 60 years.

The bodies have been deposited at the Polonnaruwa Hospital morgue for a post-mortem examination. Further investigations are being conducted by the Polonnaruwa Police.

**Police Media Division.**